## සාමාන්‍ය සමය විසිතුන්වන ඉරුදින | දේව ප්‍රකාශන

07-09-14

## පළමුවන දේව ප්‍රකාශනය

එසකියෙල් 33:7-9

එසකියෙල් දිවැස්ප්‍රසාදී තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"දුෂ්ඨයාට අවවාද දෙන්නට මැළිවන්නා ඔහුගේ මරණය ගැන වගකිව යුත්තේය."**

"එසේම, මනුෂ්‍ය පුත්‍රය, මම නුඹ ඊශ්‍රායෙල් සෙනගට මුර සෙබළෙකු කළෙමි. නුඹද මාගේ මුවින් වචනය අසා මාගේ නාමයෙන් ඔවුනට අවවාද කරන්න. එම්බා දුෂ්ඨය, නුඹ නසිනවාම ඇතැයි මා දුෂ්ඨයාට කී කල්හී තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස දුෂ්ඨයාට අවවාද කිරිමට නුඹ කතා නොකර සිටියොත්, දුෂ්ඨ වූ ඔහු තමාගේ පාපයෙහිම නසිනු ඇත. එහෙත් නුඹ ඔහුගේ මරණය ගැන වගකිව යුත්තා වශයෙන් මම සලකමි. එසේ වී නමුත් තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස නුඹ ඒ ගැන දුෂ්ඨයාට අවවාද කළ කල්හි ඔහු තමාගේ මාර්ගයෙන් නොහැරුණොත්, ඔහු තමාගේ අයුතු කම නිසා නසිනු ඇත. එසේ වුවොත් නුඹේ ප්‍රාණය නුඹ ගළවා ගනු ඇත."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 95:1-2, 6-8

පිළිතුර: සමිඳාණන් පවසන දෙයට සවන් දෙමු.

ගීය: එන්න, සමිඳුන් හට ප්‍රීති ප්‍රමෝදයෙන් ගායනා කරමු. අප මිදූ පර්වතයාණන් හට සාදු හඬ නගා තුති ගී ගයමු. තුති ගී ගයා එතුමන් අබිමුවට ගමන් කරමු. එතුමන් හට ජය මංගල ගී ගයමු.

එන්න, හිස නමා එතුමන් හට නමස්කාර කරමු. අප මැවූ සමිඳුන් අබිමුව දණින් වැටෙමු. එතුමාණෝ අපේ දෙවිඳාණෝ ය. අපි එතුමන්ගේ සෙනග ය. එතුමාණන් පෝෂණය කරන බැටළුවෝ ය. එතුමාණන් පවසන දේට සවන් දුන්නොත් යහපත!

"පාළුකරයේ මස්සා නම් ස්ථානයේ සිටි දවසේ දී මෙන් ද මෙරිබා නම් ස්ථානයේ දී මෙන් ද ඔබේ සිත් දැඩි කර නොගන්න. එහි දී ඔබේ ආදි පියවරු මා පරීක්ෂා කළෝ ය. මාගේ ක්‍රියා දැක දැකත් මට අභියෝග කළෝ ය."

## දෙවන දේව ප්‍රකාශනය

රෝම 13:8-10

පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

"ප්‍රේමය නම් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ඉටු කිරිමය."

එකිනෙකාට ප්‍රේම කිරීම හැර අන් කිසිවක් ගැන කිසිවෙකුට ණය ගැති නොවන්න. අසල්වැසියාට ප්‍රේම කරන්නෝ ව්‍යවස්ථාව ඉටු කරති. මන්ද, "කාමමිථ්‍යාචාරය නොකරන්න, මිනී නොමරන්න, සොරකම් නොකරන්න, ලෝභ නොවන්න" යන ආඥා ද තවත් අමතර ආඥා ඇත්නම් ඒවා ද, "නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න" යන පාඨයෙහි සම්පිණ්ඩනය වී ඇත. ප්‍රේමය අසල්වැසියාට නපුරක් නොකරයි. එබැවින් ප්‍රේමය නම් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ඉටු කිරීම ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සුපුවත් ජය නද** 2 කොරන්ති 5:19

ආලේලූයා! ආලේලූයා

> ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන, දෙවියන් වහන්සේ, ලෝකය තමන් වහන්සේට සමගි කරගනිමින්, ඒ සමගි කිරීමේ සේවය අපට භාර දුන් සේක.

ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** මතෙව් 18:15-20

මතෙව් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"ඔබ කියන දේ ඔහු පිළිගත්තොත් ඔබ ඔබේ සහෝදරයා දිනා ගත්තෙහිය."**

"ඔබගේ සහෝදරයා ඔබට විරුද්ධ ව පව් කළොත්, පෞද්ගලික ව ඔහු හමු වී ඔහුගේ වරද පෙන්වා දෙන්න. ඔබ කියන දේ ඔහු පිළිගත්තොත්, ඔබ ඔබේ සහෝදරයා දිනාගත්තෙහි ය. නොපිළිගත්තොත්, සාක්ෂිකාරයන් දෙදෙනෙකුගේ හෝ තුන් දෙනෙකුගේ හෝ සාක්ෂියෙන් හැම පැමිණිල්ලක් ම ස්ථිර වන පිණිස ඔබ සමග තවත් එක් කෙනෙකු නොහොත් දෙදෙනෙකු කැඳවාගෙන යන්න. ඔහු ඔවුන් කියන දේත් නොපිළිගත්තොත්, සභාවට දන්වන්න. සභාව කියන දේත් නොපිළිගත්තොත්, ඔහු විජාතිකයෙකු හෝ අයකැමියෙකු මෙන් සලකන්න.

"සැබැවින් ම මම ඔබට කියමි, ඔබ පොළොවෙහි දී යමක් බඳින්නහු ද, එය ස්වර්ගයෙහි දී බඳිනු ලබන්නේ ය. ඔබ පොළොවෙහි දී යමක් මුදන්නහු ද, එය ස්වර්ගයෙහි දී මුදනු ලබන්නේ ය. නැවතත් මම ඔබට කියමි, පොළොවෙහි ඔබෙන් දෙදෙනෙක් තමන් අයැදින කවර දෙයක් ගැන වුව ද එකඟ වන්නෝ නම්,

ස්වර්ගයෙහි වන මාගේ පියාණන් වහන්සේගෙන් ඒ දෙය ඔවුන්ට ලැබෙන්නේ ය. මන්ද, යම් තැනක දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ මාගේ නාමයෙන් රැස් ව සිටිත් ද එතැන ඔවුන් මැද මමත් වැඩ සිටිමි."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.